ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

අති විශෙෂ

අංක 2470/02 - 2026 ජනවාරි මස 05 වැනි සඳුදා - 2026.01.05

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# III වැනි කොටස - ඉඩම්

## ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම්

ශුද්ධි පත්‍රය

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

7 වැනි වගන්තිය යටතේ දැන්වීම

*මගේ යොමු අංකය*: එන්සීපී/එච්ජී/එල්02/462.
*ඉඩම් අමාත්‍යාංශයේ යොමු අංකය*: 03ජේ/80/ඩබ්එස්/498.

උක්ත ශීර්ෂය යටතේ 2009 දෙසැම්බර් මස 10 වැනි දිනැති අංක 1631/28 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *අති විශෙෂ ගැසට් පත්‍රයේ* අංක 12-781 යටතේ ම විසින් පළකරන ලද, 2010 ජූලි 28 දිනැති අංක 1664/15 දරන *ගැසට් පත්‍රයේ* අංක 08-254 යටතේ හා 2025 ඔක්තෝබර් 28 දිනැති අංක 2460/04 දරන *ගැසට් පත්‍රයේ* අංක EOG 10-0245 යටතේ සංශෝධිත ඉඩම් අත්කර ගැනීමේ පනතේ 7 වැනි වගන්තියේ දැන්වීමෙහි සඳහන් දිනයන් ඉවත්කොට ඒ වෙනුවට වෙනත් දිනයන් ආදේශ කිරීමෙන් එම දැන්වීම් පහත සඳහන් පරිදි සංශෝධනය කරනු ලබන බව මෙයින් දැනුම් දෙනු ලැබේ.

| ඉවත් කළ යුතු දිනයන් | ඉවත් කළ යුතු දිනයන් වෙනුවට ආදේශ කළ යුතු දිනයන් |
|---|---|
| 2025 නොවැම්බර් 25 | 2026 ජනවාරි 27 |
| 2025 නොවැම්බර් 18 | 2026 ජනවාරි 20 |

**ආර්. අයි. බී. සන්ධ්‍යා පී. රත්නමලල,**
ප්‍රාදේශීය ලේකම්,
හිඟුරක්ගොඩ.

2025 දෙසැම්බර් මස 30 වැනි දින,
හිඟුරක්ගොඩ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී ය.

EOG 01 - 0040

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

7 වැනි වගන්තිය යටතේ දැන්වීම

*ප්‍රා.ලේ. යොමු අංකය*: ම/සං/ඉ.අ/OCH/233.
*කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් හා වාරිමාර්ග අමාත්‍යාංශයේ යොමු අංකය*: 4-3/7/2019/HW/90.

මහජන කටයුත්තක් සඳහා අවශ්‍ය පහත දැක්වෙන ඉඩම/ පරවශතාවය ලබාගැනීමට ආණ්ඩුව අදහස් කරන බැව්, ඉඩම් අත්කර ගැනීමේ පනතේ 7 වැනි වගන්තියේ (1) වැනි උපවගන්තිය යටතේ මෙයින් දැනුම් දී සිටිමි.

*ලබාගැනීමට බලාපොරොත්තු වන ඉඩමේ/පරවශතාවේ විස්තර :-*

බස්නාහිර පළාතේ, ගම්පහ දිස්ත්‍රික්කයේ, මහර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, අංක 245ඒ, සූරියපාලුව දකුණ ග්‍රාම නිලධාරී වසමේ, සූරියපාළුව ගමේ පිහිටි සර්වේයර් ජනරාල් වෙනුවෙන් ගම්පහ දිස්ත්‍රික් ජ්‍යෙෂ්ඨ මිනින්දෝරු අධිකාරි විසින් 2022.03.07 දිනැතිව පිළියෙල කරන ලද කැඩැස්තර සිතියම් අංක 510821, කලාප අංකය 05, පත්‍ර අංකය 5 හි පෙන්නුම් කර ඇති මුළු බිම් ප්‍රමාණයෙන් හෙක්ටයාර් 0.0329 ක් වූ පහත සඳහන් ඉඩම් කොටස් (02):

**01. කැබලි අංක 379**
ඉඩමේ නම: කෝන්ගහවත්ත; විස්තරය: ගෙවත්ත, අවුරුදු 20 -30 පමණ වයසැති පොල් ගස් 4 ක්, අවුරුදු 10 - 15 පමණ වයසැති කාබරංකා ගසක් සහ අවුරුදු 1 -5 පමණ වයසැති පොල් පැලයක් ඇත; හිමිකම් කියන අය: රජය; මුල් හිමිකම් පාන්නා: පහින්දර දේවගේ චමින්ද උදය ශාන්ත, අංක 16/1/බී, බණ්ඩාරවත්ත, කඩවත (අත්කර ගැනීමේ කටයුතු අවසන් කිරීම සඳහා; ප්‍රමාණය: හෙක්. 0.0080.



*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

02. කැබලි අංක 385
ඉඩමේ නම: -; විස්තරය: පාර; හිමිකම් කියන්නා: රජය; මුල් හිමිකම් පාන්නා: සොයාගත නොහැක (අත්කර ගැනීමේ කටයුතු අවසන් කිරීම සඳහා); ප්‍රමාණය: හෙක්. 0.0249.

ඉහත සඳහන් ඉඩමට/පරවශතාවයට හිමිකම්, අයිතිවාසිකම් හෝ වෙනත් සම්බන්ධකම් කියා සිටින සියලු දෙනාම තම තමන් හෝ ඔවුන්ගේ ලියකියවිලිවලින් බලයලත් අයවලුන් හෝ 2026.01.28 වැනි දින පෙ.ව. 10.00 ට මහර ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී මා සම්මුඛ විය යුතුයි.

තව ද, 2026.01.21 වැනි දිනට මත්තෙන් ඒ ඉඩම/ පරවශතාවය සම්බන්ධයෙන් ඔවුන්ගේ අයිතිවාසිකම්වල ස්වභාවයත් එකී ඉඩම/පරවශතාවය ලබා ගැනීම ගැන වන්දි ඉල්ලීමට ඇති කරුණු පිළිබඳ විස්තරත් වන්දි මුදල සහ ඒ මුදල ගණන් බැලූ හැටිත් මා වෙත පිටපත් දෙකක් සහිත වූ ලියවිල්ලකින් දැනුම් දිය යුතුය.

**ජී. බී. එම්. ලලිත් බණ්ඩාර,**
ප්‍රාදේශීය ලේකම් හා ඉඩම් අත්කර ගැනීමේ නිලධාරි,
මහර.

2026 ජනවාරි මස 01 වැනි දින,
මහර ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී ය.

EOG 01 - 0041

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.